**ශීර්ෂය - 19 පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2015 වර්ෂය**

---

ශිර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුලා වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 21 දින පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුලා හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 84.45 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 65.75 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 18.70 ක් හෙවත් සියයට 22.14 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 71.75 | 61.13 | 10.62 | 14.80 |
| මූලධන | 12.70 | 4.62 | 8.08 | 63.62 |
| එකතුව | 84.45 | 65.75 | 18.70 | 22.14 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කාර්යාලයට අදාල විෂය අංක 01901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.26 | 1.92 | 1.26 | 1.76 | 8.00 | 4.81 |

## 2.3 විගණන නිරීක්ෂණය

පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීත්ෂණය |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඈ) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (උ) | විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඌ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (එ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විගණන සාක්ෂි නොවීම

---

නිලධාරීන් 70 දෙනෙකු සඳහා දින 03 ක නේවාසික පුහුණු වැඩසටහනක් රු.337,697 ක් වැය කර පවත්වා තිබුණි. එයට සහභාගී වූ නිලධාරීන්ට නවාතැන් පහසුකම් සහ ආහාරපාන සඳහා රු.287,846 ක් වැය කර තිබුණි. එම වියදම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට අවශ්‍ය නිලධාරීන්ගේ පැමිණීම සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

---

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 01 කට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

#### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

#### 3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනිමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 4.45 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 3.77 ක් උපයෝජනය කිරිම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන පිළියෙළ කර නොතිබුණි.

#### 3.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජූනි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | ------------------------------- | ------------ | -------------------- |
| | | | රු. | |
| (අ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------------<br>-- | | |
| | (i) | මුදල් රෙගුලාසි 139 (4) , 264 (1) | 3,227,624 | ගෙවීම් සඳහා විධිමත් කුවිතාන්සියක් ලබා ගෙන නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 245 , 257 | 378,517 | ගෙවීම් වවුචර් 03 කට අදාල ගෙවීම් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබීම. |
| (ආ) | | ජනරජයේ ගැසට් නිවේදන<br>----------------------------- | | |
| | | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | 337,697 | කිසියම් පාර්ශවයකට රු.25,000 කට වැඩිවන මුදල් ප්‍රමාණයක් ගෙවන විට මුද්දර ගාස්තු අයකර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |

**3.6 කාර්යසාධනය**

**-----------------**

2015 වර්ෂයේ විපක්ෂ නායක කාර්යාලයේ කාර්යසාධනය, විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස 2016 මැයි 20 දිනැති ලිපියෙන් ඉල්ලා ඇතත් 2016 ජූලි 15 වන විටත් එම කාර්යසාධනය පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**-----------------------------------------------------------------------**

කාර්යාලයේ නිලධාරීන් සඳහා දින 03 ක නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව තරඟකාරි ආයතන තුනකින් මිල ගණන් ලබාගැනීමකින් තොරව පෞද්ගලික විනිශ්වය මත ආයතනයක් තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා රු.337,697 ක් ගෙවා තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**------------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 12 | 12 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 18 | 14 | 4 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 30 | 10 | 20 |
| | එකතුව | 66 | 42 | 24 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 24 ක් පැවැතී තිබුණත්, 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබුණු විසර්ජන ගිණුම අනුව සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතිම බලපා නොතිබුණි.